# ගෝමරන්කඩවල හා කුච්චවේලි වනයෙන් සැඟවුන පුරවිද්‍යාත්මක උරුමය.

ආර්.එම්.එස්.දේවින්ද, එස්.එස්.ජේ.බස්නායක, ඒ.එච්.එම්.ජේ.එම්.අතපත්තු එම්.වී.ඒ.ආර්.දිශාන්ත, එම්.ආර්.එන්. ජයසිංහ*

නැගෙනහිර පළාතේ ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ ගොමරන්කඩවල හා කුච්චවේලි යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ වලට අයත් මොරවැව, මයිල වැව, නාග කන්ද හා සෙම්බිමලේ යන ග්‍රාමයන් හි වනයෙන් වැසි පවතින අතීත මානව ක්‍රියාකාරකම් හෙළි කරන්නා වූ ස්මාරකයන් අහඹු ගවේෂණයට ලක් කිරීම මෙම අධ්‍යයනයේ අරමුණයි.

ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ ප්‍රෞඪ උරුමයකට හිමිකම් කියන්නා වූ පුරාවිද්‍යාත්මක උරුමයන් රාශියක් මෙම ගවේෂණයේ දී හඳුනා ගත හැකි වූ අතර ඒවා බොහොමයක් ත්‍රස්තවාදී උවදුරු නිධන් හොරු විවිධ ස්වභාවික ආපදාවන්ට ලක්ව හායනයට ලක්ව තිබෙනු දැක ගත හැකිය. මෙහිදී ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඓතිහාසික යුගයේ යැයි සිතිය හැකි සාධක මෙන්ම ඓතිහාසික යුගයට අයත් ශිලා ලේඛන, ගොඩනැගිලි නෂ්ටාවශේෂ, දාගැබ් කොටස්, වැව්, අභාවයට ගිය වාරි මාර්ග, ප්‍රාකාර, පොකුණු, ගල් පියගැට මෙන්ම මෑත කාලීන යුගයට අයත් භූමි පරිභෝග රටාවන් වැනි මානව කෘති රාශියක් හඳුනාගත හැකිය. මේවයේ ඇතැම් ස්ථානවල අවිධිමත් සංරක්ෂණ කටයුතු සිදුවී ඇත. මෙම පුරාවිද්‍යා උරුමයන් නිසි පරිදි සංරක්ෂණය කොට විධිමත් උරුම කළමනාකරණ ආකෘතියකට යටත් කිරීමේ අවශ්‍යතාව පවතින බව කිව යුතුමය. එම නිසා වගකිව යුතු නිළධාරීන්ගේ හා ආයතනවල මැදිහත් වීමෙන් විධිමත් ගවේෂණයක් කොට කැනීම් සංරක්ෂණ කටයුතු සිදු කිරීමට මෙම අධ්‍යනය මගින් යෝජනා කරන අතර එමගින් වැළලී ගිය විශාල ඉතිහාසයක් අනාවරණය කරගැනීමට හැකි වනවා නිසැකය.

ප්‍රමුඛ පද :ගවේෂනය,මානවකෘති,උරුමය, සංරක්ෂණය, උරුම කළමනාකරණය.

* **පුරාවිද්‍යා අධ්‍යනාංශය , කැලණිය විශ්ව විද්‍යාලය** sanidudevinda@gmail.com